**එක්සත් ජනපද තානාපති කාර්යාලය**
**කොළඹ**

# මාධ්‍ය නිවේදනය

Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: ohararm@state.gov ● http://lk.usembassy.gov

Release No. 20170808

**එක්සත් ජනපද තානාපති කාර්යාලය වරාය හා රේගු ආරක්ෂාව පිළිබඳව පුහුණුවක් පවත්වනු ලබයි**

**අගෝස්තු 8 වැනිදා කොළඹදීය.** එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂක වැඩසටහන (EXBS) මගින් ශ්‍රී ලංකාව, මාලදිවයින, ඉන්දියාව හා බංග්ලාදේශය යන රටවල රේගු සහ වෙරළාරක්ෂක නිලධාරීන් 18 දෙනෙකු වරාය හා රේගු කටයුතු සම්බන්ධයෙන් පුහුණු කරනු ලැබීය. මෙම පුහුණුව 2017 ජූලි මස 31 වැනි දින සිට අගෝස්තු 04 වැනිදා දක්වා කොළඹදී පැවැත්විණි. මෙම පුහුණුව කොළඹදී පැවැත්වුණු අතර සම්බන්ධීකරණය සිදුකරණ ලද්දේ EXBS විසිනි.

සියලුම ආකාරයේ නීති විරෝධී භාණ්ඩ ආනයන පරීක්ෂා කිරීම, හඳුනාගැනීම සඳහා වූ නවීනතම තාක්ෂණික ක්‍රම පිළිබඳව ඉගෙන ගැනීමට මෙම පුහුණුවට සහභාගිවූවන්ට හැකිවිය. ඊට අමතරව ආනයන හා අපනයන භාණ්ඩ මෙහෙයුම්, භාණ්ඩ තොග ඉලක්ක කිරීම තක්සේරු කිරීම, අවදානම් කළමනාකරණය සහ අනතුරුදායක භාණ්ඩ සහ ද්‍රව්‍ය මෙහෙයුම් කරන ආකාරය පිළිබඳව නව කුශලතාවන් වර්ධනය කරගැනීමට ඔවුන්ට මෙහිදී අවස්ථාව උදාවිය. මහත් විනාශයක් සිදුකළ හැකි ආයුධ අඩංගු වන්නා වූ භාණ්ඩ තොග සහ අවසර නොලත් පුපුරණ ද්‍රව්‍ය සහ උපකරණ සම්බන්ධයෙන් වරායේදී ආරක්ෂක පියවර අනුගමනය කළ යුතු අන්දම පිළිබඳව දැනුම්වත් කිරීමටද මෙම පුහුණුවේදී විශේෂ අවධානය යොමුකරන ලදී.

අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂක වැඩසටහනේ (EXBS) අරමුණ වන්නේ මහත් විනාශයක් සිදුකළ හැකි ආයුධ ප්‍රචලිත වීම ව්‍යාප්ත වීම වැළැක්වීමත් කළාපීය සාමය සහ ස්ථාවරත්වයට තර්ජනයන් වන්නාවූ සාම්ප්‍රදායික අවි භාවිතය නවතාලීමත්ය. අපනයන පාලන සහ දේශසීමා ආරක්ෂණ වැඩසටහන අවිභාවිතය ප්‍රචලිත වීම වැළැක්වීම සඳහා ක්‍රමෝපායයන් ගණනාවකින් අනුගමනය කරනු ලබයි. වෙළඳාම පාලනය කිරීම, බලපත්‍ර ලබාදීම සහ නීත්‍යානුකූල /නියාමන ක්‍රියාමාර්ග සඳහා තාක්ෂණ සහයෝගය ලබාදීම හා වරාය, දේශසීමා සහ නීතිය ක්‍රියාවට නැවීමේ නිලධාරීන්ට පුහුණු සහ උපකරණ ලබාදී ආදිය මෙයට ඇතුළත්වේ.

# # #